# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 38 දරන

# ළමයින් දරුකමට හදගැනීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 8 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක

මිළ : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

## 1979 අංක 38 දරන ළමයින් දරුකමට හදාගැනීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 71/78.

ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1979 අංක 38 දරන ළමයින් දරුකමට හදාගැනීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ (ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 6 දරන පනතින් සංශෝධිත) 3 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 61 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

'(6) ශ්‍රී ලංකාවේ වාසය නොකරන්නා වූ ද වසතිය නොමැත්තා වූ ද යම් ඉල්ලුම්කරුවකුට පක්ෂව හෝ එසේ වාසය නොකරන්නා වූ යම් ළමයකු සම්බන්ධයෙන් හෝ දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය:

එසේ වුවද, ශ්‍රී ලංකාවේ වාසය නොකරන්නා වූ ද වසතිය නොමැත්තා වූ ද, ස්වාමිපුරුෂයකු හා භාර්යාවක විසින් හවුල් ඉල්ලීමක් කරන ලද විට, අවසර දීමට තිබෙන දරුකමට හදාගැනීම පිළිබඳ සමාජයීය සහ මානසික තත්ත්වය පිළිබඳව සහ 4 වන වගන්තියේ සඳහන් කාරණා පිළිබඳව වාර්තාවක් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගෙන් ලබාගෙන, එය සලකා බැලීමෙන් පසුව, ඒ හවුල් ඉල්ලීම ඉදිරිපත් කළ ඉල්ලුම්කරුවන්ට පක්ෂව දරුකමට හදාගැනීමේ ආඥාවක් කිරීම යුක්ති සහගත බවට පත් කරන විශේෂ කරුණු තිබෙන බව අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක දරුකමට හදාගැනීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය. ඒ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා අධිකරණය විසින් නියම කරන ලද කාලසීමාව ඇතුළත කොමසාරිස්වරයා විසින් ඒ වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ කාලසීමාව අධිකරණය ඒ වාර්තාව කැඳවූ දිනයෙහි සිට දින දහ හතරකට අඩු හෝ දින විසි අටකට වැඩි හෝ නොවිය යුතු ය. තව ද, ඉල්ලුම්කරුවන්ගේ රට විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් දෙනු ලබන්නා වූ ද, ඒ රටෙහි සිටින ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතීත නියෝජිතයා විසින් සත්‍ය බවට සහතික කරනු ලබන්නා වූ ද පරිසර අධ්‍යයන වාර්තාවක් ද කොමසාරිස්වරයා විසින් ඒ වාර්තාවට ඇමිණිය යුතු ය.

මේ උපවගන්තියේ "පරිසර අධ්‍යයන වාර්තාවක්" යන්නෙන් ඉල්ලුම්කරුවන්ගේ මානසික ස්වාස්ථ්‍යය, ඔවුන්ගේ සමාජයීය, ආගමික හා ආර්ථික පසුබිම සහ ළමයකු දරුකමට හදා ගැනීමට ඔවුන්ගේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක් අදහස් වේ.'.

ඒ 41901- -12,600 (79/05)

මේ පනත අදාළ කිරීම.

3. මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි යම් අධිකරණයක විභාග කරනු ලැබීමට තිබෙන සෑම ඉල්ලීමකට ම සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් පසු ඉදිරිපත් කරනු ලබන එවැනි සෑම ඉල්ලීමකට ම අදාළ විය යුතු ය.